# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2003 අංක 12 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 මාර්තු මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 මාර්තු මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 5.50 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

**2003 අංක 12 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2003 මාර්තු මස 20 වන දින]

එල්.ඩී.—ඕ. 53/2002.

**1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

1. මේ පනත 2003 අංක 12 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

1971 අංක 45 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. 1988 අංක 51 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) (2) වන උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(අ) තත් කාර්ය සඳහා ඒ සේවායෝජකයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත සහ ඒ ඉල්ලීමේ පිටපතක් අදාළ කම්කරුවා වෙත භාර දීමෙන් පසු සහ කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් අදාළ කම්කරුවාට ලබා දීමෙන්, පසු අනුමතය ලබා දීම හෝ ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය හැකි ය ; "

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(2අ) (2) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් කොමසාරිස්වරයා වෙත ලැබීමෙන් දින තුනක් ඇතුළත, එම ඉල්ලීම පිළිබඳව තමාගේ ප්‍රතිචාරය,

ඒ ඉල්ලීම තමා වෙත ලැබීමෙන් දින හතක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස අදාළ කම්කරුවාගෙන් ඉල්ලා සිටීම, කොමසාරිස්වරයාගේ කාර්යය වන්නේ ය:

එසේ වුව ද, ඉහත සඳහන් කාලය ඇතුළත ප්‍රතිචාර දැක්වීමට කම්කරුවා අසමත්වන අවස්ථාවක, ඒ අසමත් වීම සිදු වූයේ ඒ කම්කරුවාට පාලනය කළ නොහැකි අවස්ථානුගත කරුණු නිසා බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක දී කොමසාරිස්වරයා විසින් දින හතක් නො ඉක්මවන වැඩිදුර කාලයක් ලබා දිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6ආ වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6ආ වගන්තිය එහි (1) වන උපවගන්තියෙහි "අවසන් කිරීමෙන් මාස හයක් ඇතුළත", යන වචන වෙනුවට "අවසන් කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6ඇ සහ 6ඈ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 6ඇ සහ 6ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :-

"6 වන හෝ 6අ වගන්ති යටතේ කරන ලද යම් නියමයක් මත මුදල් ගෙවා නොමැති අවස්ථාවක දී මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කරනු ලැබිය යුතු බව.

6ඇ. මේ පනතේ 6 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ හෝ 6අ වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් යම් මුදලක් කම්කරුවකුට ගෙවන ලෙස නියම කර ඇති අවස්ථාවක, ස්වකීය සේවායෝජකයා විසින් ඒ කම්කරුවා රක්ෂාවෙහි නියුක්ත කරනු ලබන හෝ රක්ෂාවේ නියුක්ත කරනු ලැබ සිටි ප්‍රදේශය කෙරෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය විසින් එම අධිකරණය වෙත ඒ කම්කරුවා ඉදිරිපත් කරනු ලබන ලිඛිත පෙත්සමක් මත, කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නියම කර ඇති කාලය ඇතුළත එම මුදල ගෙවා නොමැති බවට සෑහීමට පත්

වන්නේ නම්, ඒ මුදල ඒ සේවායෝජකයා විසින් ඒ කම්කරුවාට ගෙවිය යුතු බවට ආඥා කළ යුතු අතර, ඒ ආඥාවට අනුකූලව ඒ මුදල ගෙවනු නොලැබුවහොත්, අධිකරණය විසින් පනවනු ලබන දඩයක් ලෙස ඒ මුදල අයකර ගනු ලැබීමටත්, එසේ අයකර ගනු ලබන මුදල ඒ කම්කරුවාට ගෙවනු ලැබිය යුතු බවටත් ආඥා කළ යුතු ය.

ගෙවිය යුතු යම් වන්දි මුදලක් ගණනය කිරීම.

6ඇ. මේ පනත යටතේ කොමසාරිස්වරයා විසින් කරනු ලබන තීරණයක් හෝ නියමයක් මත වන්දි මුදලක් ලෙස කම්කරුවකුට ගෙවිය යුතු යම් මුදලක්,අමාත්‍යවරයා විමසා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතු සූත්‍රයකට අනුව ගණනය කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. 1988 අංක 51 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "6 වන වගන්තිය හෝ 6අ වන වගන්තිය යටතේ කරනු ලැබූ නියෝගයක්" යන වචන වෙනුවට "6 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ හෝ 6අ වගන්තිය යටතේ කරනු ලබන නියමයක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "6 වන වගන්තිය හෝ 6අ වන වගන්තිය යටතේ කරනු ලැබූ නියෝගයක්" යන වචන වෙනුවට "6 වන වගන්තියේ (2) වන උපවගන්තිය හෝ 6අ වගන්තිය යටතේ කරනු ලබන නියමයක්" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.